## 3.10 වර්ග දෙකක අන්තරයෙහි සාධක විමසීම සඳහා උපකරණයක් නිමවීම හා භාවිතය

(අ) පෙර දැනුම

i. සංයුක්ත තල රූපයක මිණුම් (දිග, පළල, පරිමිතිය, වර්ග ඵලය)
ii. ඍජුකෝණාස්‍රය, සමචතුරස්‍රය, අවශ්‍ය නම් ත්‍රිපීසියම ...... වැනි තල රූපවල වර්ග ඵලය
iii. එකම වර්ග ඵලය සඳහා ස්වරූප දෙකකින් වීජීය ප්‍රකාශ හා ඒවා අතර සම්බන්ධ
iv. වීජීය පද දෙකක ඓක්‍යය, ගුණිතය, අන්තරය, සඳහා වීජීය ප්‍රකාශන ගොඩ නැගීම.

(ආ) උපකරණය සහ එහි උපාංග



13 උපකරණය



14 උපකරණය

(ඇ) උපකරණය නිමවුමට කාර්යය පත්‍රිකාව

i. වර්ණ A 4 කඩදාසියක ABCD සමචතුරස්‍රය ද, එහිම DEFG සමචතුස්‍රය ඇඳ කපා ගන්න.
ii. BF යා කිරීමෙන් X, Y, Z කොටස් තුන ලකුණු කර ගන්න. X-Ray කඩදාසියකින් X, Y, Z කොටස් තුන කපා ගන්න.
iii. D හි දී රාමුවට ද, AU හි මධ්‍ය ලක්ෂයේ දී පටියක් ද වන සේ ඇමුණුම් වාසි තබා කපා ගන්න.
iv. X කොටස් (1) හි ඇඳ ගත් ABCD සමචතුරස්‍රය මත රඳවන්න.
v. D හි දී හා M හිදී Y හිදී Y හා Z කොටස් අසව් කර ගන්න.

(ඈ) උපකණය භාවිතයට කාර්යය පත්‍රිකාව

i. AB=a නම් ABCD හි වර්ග ඵලය =
ii. DE=b නම් DEFG හි වර්ග ඵලය =
iii. DEFG භ්‍රමණය කර ඉවත් කළ විට ඉතිරි කොටසේ වර්ග ඵලය =
iv. M හරහා Z කොටස BFKL මත සමපාත කළ විට ලැබෙන CGKL ඍජුකෝණාස්‍රයේ වර්ග ඵලය =
v. එවිට (1) හා (2) අතර සම්බන්ධය